ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින්වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක්වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක්වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවටවන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහිවන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, වත්කම මිලදී ගත් දිනය හා වටිනාකම ඇතුළත් ලැයිස්තුවක් පමණක් පවතින අතර එහි වත්කම්වලට අදාළ වර්ෂයේ ක්ෂය වටිනාකම හා වර්ෂයේ ආරම්භයේ හා අවසානයේ සමුච්චිත ක්ෂය වටිනාකම් ආදිය දක්වා නොතිබුණි. මේ හේතුවෙන් එක් එක් වත්කම් ක්ෂය කර අවසන් වී තිබේද යන්න පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද එම වත්කම් ලැයිස්තුවේ පරිගණක හා කාර්යාල උපකරණවල අගයන් හා මූල්‍ය ප්‍රකාශනයේ සඳහන්ව ඇති එම අගයන් අතර රු. 224,440 ක වෙනසක් නිරීක්ෂණය විය.	ඉදිරියේදී මෙම අඩුපාඩුව මඟ හරවා ගැනීමට කටයුතු කරනු ඇත.	නිවැරදි ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කිරීම නොපමාව සිදුකළ යුතු අතර ඒ අනුව වත්කම් ශේෂයන් හා ක්ෂය වෙන්කිරීම් නිවැරදි කළ යුතුය.

1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පසු ගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කර තිබුණ ද (Restated) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 54 ඡේදය ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරීම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සිදුකර නොතිබුණි.	ඉදිරියේදී මෙම අඩුපාඩුව මඟහරවා ගැනීමට කටයුතු කරනු ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 54 ජේදය ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ 4 වන මහලේ ස්ථාපිත කර එම දෙපාර්තමේන්තුවේ විදුලි හා ජල සම්බන්ධතාවයන්ද ඉංජිනේරුවරුන්ගේ සභාව විසින් භාවිතා කරනු ලැබුවද දෙපාර්තමේන්තුව සමඟ ඒ සම්බන්ධයෙන් කිසිදු ගිවිසුමකට එළඹ නොතිබුණි. එසේම එම දෙපාර්තමේන්තුවට කිසිදු ගාස්තුවක් හෝ ගෙවනු නොලබන බැවින් ඉදිරියේදී පැන නැගිය හැකි අසම්භාව්‍ය බැරකම් සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 8 හි 100 ඡේදයට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කර නොතිබුණි.	මේ පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 8 හි 100 ඡේදයට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කිරීමට සටහන් කර ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පැන නැගිය හැකි අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉකුත් වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලද රු.795,000 ක ලියාපදිංචි ගාස්තු ආදායම සමුච්චිත අතිරික්තයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.795,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.	ආදායම් වාර්තාකරණ ප්‍රමිතියට අනුකූලව 2023 වර්ෂය සඳහා උපචිත පදනම මත රු.1,000,000 ක් 2024 වර්ෂයේදී ලැබීමට අපේක්ෂා කරන ලදී. නමුත් එකතු වූ මුදල රු.1,795,000 ක් නිසා වැඩිපුර ලැබුණු රු.795,000 ක මුදල 2024 වර්ෂය සඳහා ආදායම් ලෙස ගිණුම්ගත	සභාවේ ආදායම් උපචිත පදනමට ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු බැවින් ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ මෙම නිවැරදි කිරීම් සිදුකළ යුතුය.

		කර ඇත. ඉංජිනේරු වෘත්තිකයන්ගේ අභිමතය පරිදි ලියාපදිංචි කිරීම සහ මුදල් ලැබීම සිදුවනු ඇත.	
(ආ)	සභාවේ නිලධාරීනියකට 2023 වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද රු. 600,000 ක විශේෂ දිරිදීමනාව සමුච්චිත ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ දිරිදීමනා වියදම් යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	මෙම ගෙවීම සිදු කරන ලද්දේ 2024 වර්ෂයේදී බැවින් එය එම වර්ෂයේ ගිණුම්ගත කිරීමට සිදුවිය. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු මග හරවා ගැනීමට කටයුතු කරනු ඇත.	කාලපරිච්ඡේදයට අදාළ වියදම් පමණක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුළ ඇතුළත් කළයුතු බැවින් ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ මෙම නිවැරදි කිරීම් සිදු කළ යුතුය.
(ඇ)	2023 හා 2024 වර්ෂයන්ට අදාළව මහාභාණ්ඩාගාරයට ගෙවිය යුතු දායකත්ව මුදල් (Contribution) එකතුව රු.2,089,365 ක් සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණු බැවින් වර්ෂයේ මෙහෙයුම් වියදම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි. තවද මෙයින් 2023 වර්ෂයට අදාළ වූ රු.1,000,000 ක දායකය සමුච්චිත ලාභයට ගැලපීමටද කටයුතු කර නොතිබුණි .	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව රු.1,000,000 ක් 2023 වර්ෂය වෙනුවෙන් අයබදු ගෙවන ලෙස අප වෙත දන්වන ලදී. ඒවන විට 2023 වර්ෂයේ ගිණුම් අවසන් කර තිබූ බැවින් ඒ සඳහා අවශ්‍ය මුදල් 2024 වර්ෂයට අදාළ මුදල්වලින් ගෙවීමට සිදුවිය. කෙසේ වෙතත් ඉදිරියේදී අයබදු නියම ආකාරයට ගෙවීමට බලාපොරොත්තුවන බැවින් ඒවා නිවැරදි ආකාරයට ගිණුම්ගත කිරීමට සැලසුම් කර ඇත.	අතිරික්තයෙන් මහාභාණ්ඩාගාරයට ගෙවූ දායක මුදල් වල අගය ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2017 අංක 04 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනතේ			

(i)	12 (ඇ) වගන්තිය	ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය වැරදි හැසිරීම්වලට අදාළව යම් කාරණා පිළිබඳව පරීක්ෂණ පැවැත්විය යුතු වුවද ඉංජිනේරු වෘත්තියේ නියැලෙන වෘත්තිකයන් විසින් අනුගමනය කළ යුතු බවට හඳුන්වා දී තිබුණු වෘත්තිය ආචාරධර්ම අනුව ඉංජිනේරුවන් විසින් කටයුතු සිදු කරන්නේ ද යන්න පිළිබඳ හඳුනා ගැනීමට හා පරීක්ෂා කිරීමට අදාළව අභ්‍යන්තර පටිපාටින් හඳුන්වා දී නොතිබුණි.	ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය වැරදි හැසිරීම්වලට අදාළව ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය නීතිරීති 2022 සැප්තැම්බර් 21 දිනැති ගැසට් අංක 2298/27 යටතේ ගැසට් කර ඇත. මේවන විට ඒ සඳහා අවශ්‍යවන අභ්‍යන්තර ක්‍රියාදාමය (Internal Process) සකස් කර ඇති අතර මෙය දැනටමත් සිදු කරමින් පවතී.	ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන් ගේ සභාව පනතේ විධිවිධාන අනුව ඉංජිනේරුවන් වෘත්තීය ආචාරධර්ම පිළිපදින්නේ ද යන්න පරීක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.
(ii)	14.1 වගන්තිය	කිසිදු ඉංජිනේරු වෘත්තිකයකු 15 වන හෝ 18 වන වගන්තිය යටතේ ඉංජිනේරු වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වී ඇත්නම් මිස එම ඉංජිනේරු වෘත්තිකයා ඉංජිනේරු වෘත්තිය හා සම්බන්ධ කටයුතුවල නියැලීම සිදු නොකළ යුතුය. ඒ අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) හා ශ්‍රී ලංකා ව්‍යවස්ථාපිත ඉංජිනේරු ආයතනය (IIESL) යන ආයතන දෙකෙහි ලියාපදිංචි සාමාජිකයින් ඉංජිනේරු සභාවේ සාමාජිකයින් ලෙස ලියාපදිංචි කිරීමට යෝජිතව ඇති අතර ඉහත ආයතන දෙකෙහි 2024 වර්ෂයේ ඉංජිනේරු වෘත්තියේ නියැළෙන 29,891 ක් සාමාජිකත්වය ලබාගෙන තිබුණු නමුත් ඉන් 17,072 ක් එනම් සියයට 57.11 ක් පමණක් ඉංජිනේරු සභාවේ ලියාපදිංචිය ලබාගෙන තිබුණි.	මෙම කරුණු සම්බන්ධයෙන් සභාව මඟින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත. ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ දත්ත පද්ධතියේ (database) නම් තිබුණු එහෙත් ලියාපදිංචි නොවූ, IESL හා IIESL සාමාජිකයන් වෙත විද්‍යුත් තැපැල මඟින් සහ කෙටි පණිවුඩ මඟින් කැඳවීම් කිරීම, වරලත් ඉංජිනේරුවරුන්ගේ ලියාපදිංචිය තහවුරු කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම, රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු ඉංජිනේරුවරුන්ගේ ලියාපදිංචි තහවුරු කරගැනීම සඳහා ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්තුමා වෙත ද දැනුම් දෙන ලදී. බඳවා ගැනීමේ හා උසස්වීම් පටිපාටීන්වලට ද ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචිය අනිවාර්ය කිරීමට යෝජනා කර ඇත.	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) හා ශ්‍රී ලංකා ව්‍යවස්ථාපිත ඉංජිනේරු ආයතනය (IIESL) ආයතන දෙකෙහි ලියාපදිංචි සියලු සාමාජිකයින් සභාවේ ලියාපදිංචි කර ගැනීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුයි.
(ආ)	2018 අංක 19 දරන විගණන පනතේ 38(1)(ඇ) සහ 38(2) වගන්ති	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් එක් එක් ආස්ථිතයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු	ඉදිරියේදී මෙම අඩුපාඩුව මඟහරවා ගැනීමට කටයුතු කරනු ඇත.	2018 අංක 19 දරන විගණන පනතේ38(1)(ඇ) සහ 38(2) වගන්ති අනුව

		ලබන බවට සහතික විය යුතු අතර එම පද්ධතියේ, සඵලදායීතාවය පිළිබඳව කලින් කල ලිඛිත සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකර එහි පිටපත් විගණකාධිපතිවරයාට ලබා දිය යුතු වුව ද සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි.		ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර කාලීනව සමාලෝචනය සිදුකර විගණකාධිපති වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	1985 අංක 01 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතේ 47 වන වගන්තිය	සභාව විසින් අරමුදලට දායක මුදල් ගෙවීමේදී ඉපයීම් ගණනය කිරීම සඳහා සේවකයින්ගේ ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා, දුරකථන දීමනා, වෘත්තීය දීමනා හා විශේෂ දීමනා අදාළ කරගෙන තිබුණි. මේ හේතුවෙන් අදාළ දීමනාවලින් සියයට 15 බැගින් සභාවේ දායක මුදල් ලෙස වැඩිපුර ගෙවා තිබූ අතර සියයට 10 බැගින් සේවකයාගේ දායකය වැඩිපුර අයකර ගෙන ගෙවා තිබුණි.	මේ පිළිබඳව කම්කරු කොමසාරිස් (සේ.අ.අ) ගේ අදහස් ලබා ගන්නා ලදී. මේ පිළිබඳව ඔවුන්ගේ අනුමැතියක් ලබා ගැනීමට අවශ්‍ය නොවන බව දන්වා ඇත.	සේවක අර්ථ සාධක අරමුදල් පනතේ නියමයන්ට අනුකූලව දායක මුදල් අයකිරීම හා ගෙවීම සිදු කළ යුතුය.
(ඇ)	1980 අංක 46 දරන සේවා නියුක්තිකයන් ගේ භාරකාර අරමුදල් පනතේ 44 වන වගන්තිය	සභාව විසින් අරමුදලට දායක මුදල් ගෙවීමේදී පාරිශ්‍රමිකය ගණනය කිරීම සඳහා ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා, දුරකථන දීමනා, වෘත්තීය දීමනා හා විශේෂ දීමනා අදාළ කරගැනීම නිසා එම දීමනාවලින් සියයට 3 බැගින් වැඩිපුර ගෙවා තිබුණි.	මේ පිළිබඳව කම්කරු කොමසාරිස් (සේ.අ.අ) ගේ අදහස් ලබා ගන්නා ලදී. මේ පිළිබඳව ඔවුන්ගේ අනුමැතියක් ලබා ගැනීමට අවශ්‍ය නොවන බව දන්වා ඇත.	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනතේ නියමයන්ට අනුව දායක මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය.
(ඉ)	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ			
(i)	VIII වැනි පරිච්ඡේදයේ 10:1 උප වගන්තිය	2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සති අන්ත හා රජයේ නිවාඩු දින 96 ක් නිවසේ සිට රාජකාරී කටයුතු ඉටුකිරීම වෙනුවෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරිනියට මාසික	නිවසේ සිට රාජකාරී ඉටු කිරීමේදී රාජකාරී කළ කාලය සහ ඉටුකල රාජකාරී පිළිබඳව තහවුරු කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ඇත. ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ වැඩ	නිවාඩු දින සේවය කිරීම හා නිවාඩු දින වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ

		වැටුපෙන් 1/20 ක් බැගින් එකතුව රු.269,841 ක් නිවාඩු දින වැටුප් ලෙස සහ රු.48,571 ක් සේවක අර්ථසාධක අරමුදල් දායකය හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් දායකය ලෙස ගෙවා තිබුණි. එසේම ඉකුත් වර්ෂයේ දී ද මේ වෙනුවෙන් රු.310,627 ක් සභාව විසින් ගෙවීම් කර තිබුණි. මීට අමතරව මෙම නිලධාරිනිය ඇතුළුව නිලධාරීන් දෙදෙනෙක් රාජකාරී දින 64 බැගින් නිවසේ සිට රාජකාරී ඉටුකර තිබියදී සමාලෝචිත වර්ෂයේදී එම නිලධාරීන් දෙදෙනා විසින් ඉතිරි කරගත් නිවාඩු දින 29 ක් සහ දින 30 ක් වෙනුවෙන් පිළිවෙළින් රු.57,300 සහ රු. 28,510 ක් ගෙවීම් කර තිබුණි.	කටයුතු අඛණ්ඩව සහ කාර්යක්ෂම සිදු කරගෙන යාමට මාර්ගගත ක්‍රමය ඔස්සේ සමහර නිවාඩු දිනවල කාර්ය මණ්ඩලය මඟින් රාජකාරී සිදු කරවා ගන්නා ලදී. නිවාඩු දින වැටුප් සභාපතිතුමාගේ අධීක්ෂණය යටතේ සිදු කිරීමෙන් රාජකාරී ඉටු කළ කාලය සනාථ කිරීම සහ සඵලදායී කාර්යභාරයක් සිදු කිරීමෙන් පසු මෙම ගෙවීම් සිදුකර ඇත.	නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.
(ii)	XII වැනි පරිච්ඡේදයේ 1:7 උප වගන්තිය	අනුමත කරන ලද නිවාඩු පිළිබඳ රෙජිස්ටරයක් 190 වෙනි පොදු ආකෘති පත්‍රය අනුව තබා ගත යුතු වුවද, සභාවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ නිවාඩු වෙනුවෙන් ඒ අනුව නිවාඩු රෙජිස්ටරයක් නඩත්තු කර නොතිබුණි.	2024 අප භාවිත කළ සහ දැනට භාවිත කරනු ලබන නිවාඩු පිළිබඳ රෙජිස්ටරයේ 190 පොදු ආකෘති පත්‍රය අනුව තිබිය යුතු සෑම අත්‍යවශ්‍ය විස්තරයක්ම අඩංගුව ඇත.	ආයතන සංග්‍රහයේ නියමයන්ට අනුකූලව නිවාඩු සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 2,541,853 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 9,319,574 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,777,721 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අනෙකුත් මෙහෙයුම් වියදම් තුළ වූ නීති වියදම් සහ වාහන මෙහෙයුම් බදු වියදම් රු. 5,672,360 කින් වැඩි වීම සහ භාණ්ඩාගාරයට ගෙවන ලද දායකත්ව මුදල් රු. 2,089,365 ක් මෙහෙයුම් වියදම් තුළ ඇතුළත් කිරීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

2023 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සභාවේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

විස්තරය	2024 රු.	2023 රු.	වෙනස වැඩිවීම/(අඩුවීම) රු.	වෙනසේ ප්‍රතිශතය සියයට
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ආදායම	21,111,994	19,596,000	1,515,994	8
මූල්‍ය ආදායම	4,920,643	7,744,148	(2,823,505)	36
පරිපාලන වියදම්	11,228,697	11,124,414	104,283	1

ගිවිසුම්ගත සේවා සහ නඩත්තු වියදම්	2,217,943	2,165,077	52,866	2
අනෙකුත් මෙහෙයුම් වියදම්	8,075,058	772,836	7,302,222	945

2.3 අනුපාත විශ්ලේෂණය

සභාවේ ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ 13:1 ක් වූ අතර ශුද්ධ ලාභ අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී සියයට 71 කින් අඩුවීමට අනෙකුත් මෙහෙයුම් වියදම්වල ඉහළයාම ඍජුවම බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 ජුලි 09 දින සිට සභාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුර සඳහා කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ JM 1-1 වැටුප් කේතය යටතේ නිලධාරිණියක් බඳවාගෙන පසුව මධ්‍යම කළමනාකරණ මට්ටමේ MM 1-1 වැටුප් කේතයට 2021 ඔක්තෝබර් 15 දින සිට පත් කර තිබුණි. අනතුරුව HM 1-3 වැටුප් කේතය යටතේ ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබිය දී එම තනතුරේ රාජකාරි ඉටුකිරිම සඳහා 2022 නොවැම්බර් 28 දින MM 1-1 වැටුප් කේතය යටතේ වූ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරිණිය පත්කර තිබුණි.	මෙම කරුණ පිළිබඳ දීර්ඝ සාකච්ඡාවක් වැටුප් කොමිෂන් සභාව, අමාත්‍යාංශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ පවත්වන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස MM 1-1 වැටුප් කේතයේ පැවති ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිළධාරි තනතුර HM 1-3 වැටුප් කේතය දක්වා වැඩි කිරීමට වැටුප් කොමිෂන් සභාව නිර්දේශ කරන ලද අතර එයට අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් එය සිදුකර ඒ බව අප වෙත ලිපියකින් දැනුම් දී ඇත.	අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සුදුසුකම් වලට අනුකූලව නිලධාරීන් පත් කිරීමට හා ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS / 1850 හා 2022 ඔක්තෝබර් 18 දිනැති ලිපිය මඟින් HM 1-3 වැටුප් කේතය යටතේ අනුමත ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරි තනතුර සඳහා බඳවා ගැනිම් සිදු කළ යුත්තේ MM 1-1 වැටුප් කේතය යටතේ දරන්නාට පෞද්ගලිකවන සේ අනුමත කර තිබුණු තොරතුරු තාක්ෂණ නිලධාරි තනතුර පුරප්පාඩු වීමෙන් අනතුරුවවන අතර එකවර තනතුරු දෙක සඳහාම බඳවා ගැනීම් සිදු නොකළ යුතුය. තවද	ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරි තනතුර HM 1-3 වැටුප් කේතයට පරිවර්තනය කර තිබුණු නමුත් දැනට එහි සේවය කරනු ලබන්නේ MM 1-1 වැටුප් කේතයට අයත් නිලධාරිනියකි. එම නිලධාරිනි HM 1-3 වැටුප් කේතයට අවශ්‍ය සියලුම අධ්‍යාපන සුදුසුකම් ද මීට අතිරේකව වෘත්තීය සුදුසුකම් ද (Professional Qualifications) සපුරා තිබුණු නමුත් අවශ්‍ය අවුරුදු 15 ක පළපුරුද්ද	බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සුදුසුකම් හා පලපුරුද්ද සහිත නිලධාරීන්ට පමණක් පත්වීම් ලබා දියයුතු යුතු අතර අවශ්‍ය සංශෝධන සඳහා පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.5 උප වගන්තිය ප්‍රකාරව රාජකාරි ඉටුකිරීමට පත් කළ යුත්තේ පුරප්පාඩු වූ තනතුරු වහාම පිරවිය යුතු නම් පමණක් වුවද ඒ අනුව HM 1-3 කේතය යටතේවන තනතුර සඳහා පුරප්පාඩුවක් නොපැවති අතර එකම රාජකාරිය බැවින් එක විට තනතුරු දෙකම ක්‍රියාත්මක කළ නොහැකි බව තවදුරටත් නිරීක්ෂණය විය. නමුත් අදාළ නිලධාරිනියට ඒ සඳහා රාජකාරි ඉටුකිරීමට පත්වීමක් ලබාදී ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රාජකාරි ඉටු කිරීමේ දීමනා, සේවක අර්ථ සාධක අරමුදලේ දායකය හා සේවක භාරකාර අරමුදලේ දායකය ලෙස පිළිවෙලින් රු.245,187 ක්, රු.36,778 ක් හා රු.7,355 ක් වශයෙන් රු.289,320 ගෙවා තිබුණි. මේ සඳහා ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12.2.6 වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද භාණ්ඩාගාර අනුමැතියකින් තොරව HM 1-3 ශ්‍රේණියට අදාළ වාහන දීමනා ලෙස රු.600,000 ක් ද, ඉන්ධන දිමනා ලෙස රු.477,595 ක් ද 2024 වර්ෂයේ ගෙවා තිබුණි. එමෙන්ම HM 1-3 වැටුප් කේතයට අවශ්‍ය සේවා පළපුරුද්ද වන වසර 15 සම්පූර්ණවන තෙක්ම රාජකාරි ඉටුකිරීම අඛණ්ඩව පවත්වා ගැනීමට සභාව විසින් තීරණය කර තිබුණි.	සම්පූර්ණ කර නොමැති නිසා එම නිලධාරිනියව අන්තර්ග්‍රහණය කර ගැනීම ද සිදු කළ නොහැකිය. කෙසේ වුවද, එම නිලධාරිනිය විසින් HM 1-3 වැටුප් කේතයට අදාළ සභාවේ කාර්යභාරයන් ඉතා කාර්යක්ෂමව සිදු කරමින් පවතී. ආයතනයේ තොරතුරු තාක්ෂණය මඟින් බෙහෙවින් යැපෙන අතර එහි තිරසර පැවැත්ම සළකා එම තනතුරේ සේවය කරන නිලධාරී HM 1-3 වැටුප් කේතයට අවශ්‍ය සේවා පළපුරුද්දවන වසර 15 සම්පූර්ණවන තෙක්ම රාජකාරි ඉටුකිරීම අඛණ්ඩව පවත්වා ගැනීමට සභාව තීරණය කර ඇත.	

3.2 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ තනතුරු 05ක් පුරප්පාඩුව වී තිබුණු අතර කර්යමණ්ඩලය බඳවා ගැනීමට හෝ තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව ආරම්භ වූයේ 2018 අගෝස්තු මාසයේදීය. එවිට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත තනතුරු 9 ක් තිබුණි. නමුත් මුල් කාලයේදී සියලු පුරප්පාඩු පිරවීමට අවශ්‍ය නොවූ බැවින් ඒ සඳහා	කාර්යභාරයට අනුව තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට හෝ අත්‍යවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.

	බඳවා ගැනීම් සිදු නොකරන ලදී. නමුත් අනාගතයේ දී මෙම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය විය හැකි බැවින් තනතුරු සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කර නැත.	

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික වාර්තාව

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදුන් රජය සතු ව්‍යාපාර සඳහාවන මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදයෙන් බැහැරව 2023 වර්ෂය සඳහා වූ සභාවේ වාර්ෂික වාර්තාව 2025 අප්‍රේල් මාසයවන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.	මෙය අපගේ පාලනයෙන් තොර හේතු නිසා තවමත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොමැත. මේ පිළිබඳව දිගින් දිගටම අප සොයා බැලූ අතර මේවන විට මෙය නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ අභ්‍යන්තර ක්‍රමවේදය සම්පූර්ණ කර ලේකම්තුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. ඉන්පසුව අමාත්‍ය මණ්ඩලය වෙත යැවීමට කටයුතු කරනු ඇත.	වාර්ෂික වාර්තාව චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් මාස 05ක් තුළ පාර්ලිමේන්තුවේ සභා ගත කළ යුතු බැවින් එම කටයුතු නොපමාව සිදුකළ යුතුය.